රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/GFS/01/01/08 – Volume I
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020.12. 21

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානින්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

**රජයේ මූල්‍ය නොවන වත්කම් (ඉඩම් හා ගොඩනැගිලි) තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම**

CIGAS වැඩසටහනෙහි ගිණුම්ගත කරන ලද තොරතුරු පරීක්ෂා කිරීමේදී බොහෝ ආයතනවල වත්කම් ලෙජර් ලැයිස්තුවේ (Asset Ledger) හා වත්කම් වාර්තාවෙහි (Asset Report) එන ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් අතර පරස්පරතාවන් පවතින බව නිරීක්ෂණය විය.

02. රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 5/2020 හි දක්වා ඇති පරිදි 2020 වසරේ ගිණුම් පියවීමට පෙර ඔබ ආයතනයේ ගිණුම්ගත කරන ලද ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම්, CIGAS වැඩසටහනෙහි වත්කම් ලෙජර් ලැයිස්තුවේ වටිනාකමටත්, වත්කම් වාර්තාවෙහි එන වටිනාකමටත් සමාන විය යුතු වේ. එබැවින් ඔබ ආයතනයේ ගිණුම්ගත කර ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් පිළිබඳව මනාව පරීක්ෂා කර බලන ලෙසත්, එහිදී යම් තාක්ෂණික සහයෝගයක් අවශ්‍ය වන්නේ නම් මෙම දෙපාර්තමේන්තුවේ පද්ධති සංවර්ධන හා පුහුණු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සම්බන්ධ කර ගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

03. තවද, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර වාර්තා කර ඇති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් නිවැරදිව CIGAS වැඩසටහන හරහා ගිණුම්ගත කරන ලෙසත්, තක්සේරු කර ඇති ඉඩම් හා ගොඩනැගිලිවලට අමතරව තවදුරටත් ඔබ ආයතනයට අයත් තක්සේරු කළ යුතු ඉඩම් හා ගොඩනැගිලි පවතී නම් ඒවාද තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

04. එමෙන්ම රජයේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමේ කාර්යය සඳහා මේ දක්වා ඔබ ආයතනය වෙතින් ලද නොමඳ සහයෝගයට කෘතඥතාව පළ කර සිටින අතර ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සළකා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කරන ලෙස ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ටී.එන්. ඉෂන්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk